සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

32 | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ............................ ව්‍යාපාර අධ්‍යයනය I කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. අවශ්‍යතා හා වුවමනා අතර පවත්නා සම්බන්ධතාවය මැනවින් ප්‍රකාශ වන වගන්තිය වන්නේ,
   1. ප්‍රථමයෙන් අවශ්‍යතා ඉටුකරගත යුතු වන අතර දෙවනුව වුවමනා සපුරාගත යුතුය.
   2. අවශ්‍යතා අනිවාර්යයෙන් ඉටුකරගත වූවත් වුවමනා එසේ නොවේ.
   3. අවශතා ඉටුවේ නම් වුවමනා සපුරා ගැනීම අවශ්‍ය නොවේ.
   4. වුවමනා සපුරාගැනීමේදී අවශ්‍යතාදී ඉටුවේ.
   5. අවශ්‍යතා ඉටුකර ගැනීම සහ වුවමනා සපුරා ගැනීම් අතර වෙනසක් නොමැත. (.....)

02. කාර්මික භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ අතර මූලික වෙනස තීරණය වනුයේ,
   1. ඉල්ලුමේ ස්වභාවය හා ඉල්ලන වාර ගණන අනුවය.
   2. භාණ්ඩවල ජීවිත කාලය අනුවය.
   3. භාණ්ඩ මිලදී ගැනීමේ අරමුණ අනුවය.
   4. භාණ්ඩවල වටිනාකම අනුවය.
   5. බෙදාහැරීමේ හා ප්‍රවර්ධන ක්‍රම අනුවයි. (.....)

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට බලපෑම් ඇතිකරන පරිසර බලවේග කාණ්ඩ කීපයකි. ඒ අතරින් ව්‍යාපාරයකට පාලනය කළහැකි පරිසර බලවේග ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   1. අයිතිකරු, ප්‍රජාව, කළමණාකරු, සම්පත්
   2. ගණුදෙනුකරු, සම්පත්, අයිතිකරු, සේවක
   3. තරගකරු, සේවක, ගනුදෙණුකරු, සම්පත්
   4. අයිතිකරු, සම්පත්, ආර්ථික, සැපයුම්කරු
   5. අයිතිකරු, සේවක, කළමණාකරු, සම්පත් (.....)

04. ව්‍යාපාරයක් පරිසර අධයනය තුළින් ළඟාකරගත හැකි ප්‍රයෝජන හා ඒවා ළඟාකර ගනීම සඳහා ඉවහල් වූ සාධක පහත A හා B තීරුවලින් දැක්වේ. ඒවා ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1. ශක්තීන් | අ) ණය පොලී අනුපාතය පහළ යාම |
| 2. දුර්වලතා | ආ) කළමණාකරණ හැකියා වැඩිවීම |
| 3. අවස්ථා | ඇ) ව්‍යාපාර කටයුතු සඳහා නීතිරීති දැඩිවීම |
| 4. තර්ජන | ඈ) මූල්‍ය දුෂ්කරතා පැවතීම |

   1. 1අ, 2ඇ, 3ආ, 4ඈ
   2. 1ආ, 2ඈ, 3අ, 4ඇ
   3. 1ඇ, 2අ, 3ආ, 4ඈ
   4. 1ඈ, 2අ, 3ඇ, 4ආ
   5. 1අ, 2ආ, 3ඇ, 4ඈ (.....)

05. ව්‍යාපාර සමාජ වගකීම් වලට අදාළ සාධක කීපයක් පහත වේ.

| | | | |
|---|---|---|---|
| A | ආර්ථික ප්‍රතිලාභ අත්කරදීම. | B | නොපිරිහෙලා බදුගෙවීම. |
| C | සමානාත්මතාවයෙන් සැලකීම. | D | ප්‍රජා සත්කාර සේවා |
| E | පරිසර හිතකාමී බව. | F | වෘත්තීය ආරක්ෂාව |

ඉහත සාධක අතරින් සමාජයට පමණක් ඉටුකරන්නාවූ සමාජ වගකීම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. A B C 2. A B D 3. A C D
4. B D E 5. B C E (.....)

06. මහ බැංකු නිත්‍ය පහසුකම් අනුපාතියකට (SFR) අයත් පොලී අනුපාතියක් නොවන්නේ,

1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය
2. බැංකු පොලී අනුපාතිකය
3. නිත්‍ය වාණිජ බැංකු අනුපාතිකය
4. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය
5. ප්‍රති මිලදීගැනුම් අනුපාතිකය (.....)

07. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් නොවන්නේ,

1. ස්වේච්ඡාවෙන්
2. දඬුවම් ලබාදීම මගින්
3. SLS ලාංඡන ක්‍රමය මගින්
4. පූර්ව අපනයන පරික්ෂාව මගින්
5. ආනයන පරික්ෂාව මගින් (.....)

08.

| | X | | Y |
|---|---|---|---|
| A | රාජ්‍ය සමාගම් | 1. | ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළහැකිය. |
| B | අක්වෙරළ සමාගම් | 2. | ව්‍යාපාර නාමය පුරස්කාරයට යටත් වේ. |
| C | වරලත් ව්‍යාපාර | 3. | ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම්ය. |
| D | ලැයිස්තුගත සමාගම් | 4. | කොටස් වෙළඳපලේ ලියාපදිංචි කෙරෙයි. |
| E | ඇපයෙන් සීමිත සමාගම් | 5. | රජයේ පාලනය යටතේ පමණි. |

ඉහත X හි ව්‍යාපාර සංවිධාන වර්ග ද, Y හි ඒ හා සම්බන්ධ ප්‍රකාශ ද දැක්වේ. ඒ අනුව X හා Yනිවැරදිව ගැලපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක්ද?

1. A -5, B - 3, C-4, D - 1, E -2
2. A - 5, B - 4, C - 3, D - 1, E - 2
3. A - 1, B - 5, C - 2, D - 3, E - 4
4. A - 1, B - 2, C - 5, D - 4, E - 3
5. A - 5, B - 3, C - 2, D - 4, E - 1 (.....)

09. පහත සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ග වල අවම සාමාජිකයන් ගණන නිවැරදිව දැක්වෙන පිලිතුර තෝරන්න.

| | පෞද්ගලික සමාගම | පොදු සමාගම | ඇපයෙන් සීමිත සමාගම | සමුපකාරය |
|---|---|---|---|---|
| 1 | 2 | 2 | 2 | 10 |
| 2 | 1 | 1 | 2 | 10 |
| 3 | 1 | 2 | 1 | 7 |
| 4 | 2 | 1 | 1 | 10 |
| 5 | 1 | 1 | 2 | 7 |

(.....)

10. 2007 අංක 7 දරණ සමාගම් පණත අනුව කොටස් හා කොටස් හිමියන්ට අදාල රෙගුලාසි ඇතුළත් ලියවිල්ල කුමක්ද?

1. කොටස් බලපත්‍රය
2. සංස්ථා ප්‍රකාශය
3. සාංගමික ව්‍යවස්ථාවලිය
4. සංස්ථාගත කිරීමේ සහතිකය
5. කොටස් සහතිකය (.....)

11. පහත දැක්වෙන්නේ ව්‍යවස්ථාදායකයකුගේ ලක්‍ෂණ හා ව්‍යවසායකත්ව කුසලතා සමූහයකි. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| A ව්‍යවසායකත්ව කුසලතා<br><br>B ව්‍යවසායකත්ව ගුණාංග | 1. අවදානම් දැරීමේ හැකියාව<br>2. නායකත්වය<br>3. නිර්මාණශීලී බව<br>4. කැපවීම<br>5. අන්තර් පුද්ගල හැකියා<br>6. සන්නිවේදන දක්‍ෂතා<br>7. ආත්ම විශ්වාසය<br>8. මූලික කළමණාකරණ හැකියා |

1. A - 1, 2, 3, 8 B - 4, 5, 6, 7
2. A - 1, 3, 4,7 B - 2, 5, 6, 8
3. A - 2, 3, 7, 8 B - 1, 4, 5, 6
4. A - 3,5, 6, 8 B - 1, 2, 4, 7
5. A - 4, 5, 6, 7 B - 1, 2, 3, 8 (.....)

12. පහත සඳහන් ආයතන කුඩා ව්‍යාපාර වර්ගීකරණය සඳහා යොදාගෙන ඇතිනිර්ණායක අදාළ ආයතනය සමඟ නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| නිර්ණායකය | ආයතනය |
|---|---|
| A - යොදාගෙන ඇති ප්‍රාග්ධනය<br><br>B - සේවක සංඛ්‍යාව | 1. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>2. කාර්මික තාක්ෂණ ආයතනය<br>3. කුඩා කර්මාන්ත ආයතනය<br>4. කාර්මික සංවර්ධන මණ්ඩලය<br>5. ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය |

1. A - 1, 2, 5 B - 3, 4
2. A - 1, 2 B - 3, 4, 5
3. A - 2, 3, 4 B - 1, 5
4. A - 3, 5 B - 1, 2, 4
5. A - 2, 4 B - 1, 3, 5 (.....)

13. චෙක්පතක MICR තීරුවේ සඳහන් තොරතුරු වනුයේ,

1. දිනය, මුදල, ආදායකයාගේ ගිණුම් අංකය
2. අණකරුගේ අත්සන, මුදල, බැංකු අංකය සහ ශාඛා අංකය
3. දිනය, ආදායකයාගේ ගිණුම් අංකය, මුදල
4. චෙක්පත් අංකය, අණලත් බැංකුවේ අංකය සහ ශාඛාවේ අංකය, අණරුගේ ගිණුම් අංකය
5. අණකරුගේ ගිණුම් අංකය, මුදල, චෙක්පත් අංකය (.....)

14. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතනයකි.

1. සේවක අර්ථසාධක අරමුදල
2. ඒකක භාර කළමනාකරණ සමාගම
3. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
4. කල්බදු මුල්‍යකරණ සමාගම්
5. කොටස් තැරැව්කරු ආයතන (.....)

15. වර්තමානයේ භාවිතා කෙරෙන කාසි හා නෝට්ටු සැලකෙනුයේ,
   1. ආරුඪ මුදල් ලෙසයි.   2. කළු මුදල් ලෙසයි.   3. විද්‍යුත් මුදල් ලෙසයි.
   4. නිමිති මුදල් ලෙසයි.   5. ආසන්න මුදල් ලෙසයි.   (.....)

16. රක්ෂණය කළහැකි අවදානමක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ,
   1. අවදානම නියත නොවීම.   2. අනාගත අලාභය මූල්‍ය වශයෙන් මැනිය හැකිවීම.
   3. සත්‍යාපනය කළහැකි වීම.   4. සම්බන්ධතාවයකින් තොරවීම.
   5. අනිවාර්ය වශයෙන් සිදුවන අවදානමක් වීම.   (.....)

17. රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව අතරට නොගැලපෙන්නේ,
   1. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය   2. රක්ෂණ ආවරණය ලබාගන්නා පුද්ගලයා
   3. රක්ෂණ යෝජනාව පිළිගන්නා රක්ෂණ සමාගම   4. රක්ෂිතයා
   5. තෙවන පාර්ශ්වය   (.....)

18. දුම්රිය මගින් ප්‍රවාහනයේදී භාවිතාවන ලියවිල්ලක් වන්නේ,
   1. දුම්රිය මාර්ග බිල්පත   2. දුම්රිය වාර්ණාව   3. නොභාර පත්‍රය
   4. දුම්රිය වාර ප්‍රවේශ පත්‍රය   5. භාරදීමේ තුණ්ඩුව   (.....)

19. ස්ථාවර මහා පරිමාණ වෙළඳ ක්‍රමයක් නොවන්නේ,
   1. ආංශික වෙළඳසැල්   2. බදු රහිත වෙළඳසැල්
   3. වෙළෙඳ සංකීර්ණ   4. වෑන් රථ හා ලොරි රථ මගින් බෙදාහැරීම්
   5. බැඳි වෙළෙඳසැල්   (.....)

20. ආනයන ක්‍රියා පටිපාටියට අදාළ පියවරක් නොවන්නේ,
   1. විදේශ ගැණුම්කරුවන් සොයාගැනීම.   2. මිල විමසුමක් යැවීම.
   3. ආනයන බලපත්‍ර ලබාගැනීම.   4. ඉන්ඩෙන්ටුව විදේශ අපනයනකරුට යැවීම.
   5. අපනයනකරුට ගෙවීම් සිදුකිරීම.   (......)

21. පහත දක්වෙන්නේ කළමනාකරණ ශ්‍රිතවලට සම්බන්ධ කාර්යයන් කිහිපයකි.
   A - ශ්‍රම විභජනය   B - පාරිසරික විශ්ලේෂණය
   C - සමායෝජනය   D - අරමුණු ස්ථාපිත කිරිම.
   E - කාර්යයන් හඳුනාගැනීම   F - දෙපාර්තමේන්තුකරණය
   G - සන්නිවේදනය.
   ඉහත දෑ අතුරන් සංවිධානකරණ ශ්‍රිතයට අදාළ කාර්යයන් පමණක් අඩංගු කාණ්ඩය කුමක්ද?
   1. A, B, C, F   2. A, B, D, G   3. A, C, D, G
   4. A, C, D, E   5. A, C, E, F   (.....)

22. සංවිධානයක සැලසුම් වර්ගකළ හැකි පදනම් සහ සැලසුම් වර්ග කිහිපයක් පහත දක්වේ.

| පදනම් | වර්ග |
|---|---|
| 1. පුළුල් බව අනුව | A උද්දේශික සැලසුම් |
| 2. කාලය අනුව | B මෙහෙයුම් සැලසුම් |
| 3. නිශ්චිතතාව අනුව | C දිගුකාලීන සැලසුම් |
| 4. භාවිත පරාසය අනුව | D ස්ථාවර භාවිත සැලසුම් |

   1, 2, 3, 4 වශයෙන් සඳහන් සැලසුම් පදනම්වලට ඇතුළත් කළහැකි සැලසුම්වර්ග අනුපිළිවෙළින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
   1. A C B D   2. B C D A   3. C A B D   4. D B C A   5. B C A D   (.....)

23. තොග යල්පැනීමේ අවදානම ඉහළ මට්ටම පවතින අවස්ථාවකට භාවිතා කළයුතු වඩාත් යෝග්‍ය තොග පාලන ක්‍රමය තෝරන්න.

1. තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය
2. ද්විත්ව භාජන ක්‍රමය
3. JIT ක්‍රමය
4. A,B,C විශ්ලේෂණ ක්‍රමය
5. අඛණ්ඩ තොග වාර්තා ක්‍රමය (.....)

24. අතිරික්ත හෝ ඌණ තොගවලින් ව්‍යාපාරයකට ඇතිවන අවාසි මගහරවා ගැනීම සඳහා ආර්ථික ඇනවුම් ප්‍රමාණය වාපාරයකට ඉතා වැදගත් වේ. ආර්ථික ඇනවුම් ප්‍රමාණය තීරණය වීමේදී දැකිය හැකි වැදගත්ම ලක්ෂණය දක්වෙන පිළිතුර වන්නේ,

1. මුලු පිරිවැය උපරිම වන අතර පවත්වාගෙන යාමේ හා ඇණවුම් කිරීමේ පිරිවැය අවම වේ.
2. මුලු පිරිවැය අවම වන අතර පවත්වාගෙන යාමේ පිරිවැය හා ඇණුවුම් පිරිවැ උපරිම වේ.
3. මුළු පිරිවැය හා ඇනවුම් පිරිවැය ද පවත්වාගෙන යාමේ පිරිවැයද සමාන වේ.
4. මුළු පිරිවැය අවම වන අතර ඇනවුම් හා පවත්වාගෙන යාමේ පිරිවැය සමාන වේ.
5. මුලු පිරිවැය හා ඇණවුම් පිරිවැය සමානවන අතර පවත්වාගන යාමේ පිරිවැය අවම වේ. (.....)

25. පහත දක්වෙන්නේ භාණ්ඩයක ජීවන චක්‍රයේ අදියයන් පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A - විකුණුම් ඉහළයාම පරිණත අදියරේදී සිදුවේ.

B - හඳුන්වාදීමේ අදියරේදී විකුණුම් ඉතා සෙමින් වැඩිවේ.

C - සංවර්ධන අදියරේදී විකුණුම් ආදායම ඉතා ඉහළ වේ.

D - වර්ධන අදියරේදී ලාභයේ ඉහළ යාමක් දක්නට ලැබේ.

E - ලාභය හීනවීම පිරිහීමේ අදියරේදී සිදුවේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් අඩංගු වන්නේ,

1. A, B හා C
2. C, D හා E
3. B, D හා E
4. B, D හා D
5. A, C හා E (.....)

26. ''විකුණුම්කරු හෝ ඔහුගේ නියෝජිතයන් හෝ සහායකයන් විසින් නිශ්චිත පුද්ගලයෙකු හෝ කුඩා කණ්ඩායමක් වෙත තම නිෂ්පාදිත ඉදිරිපත්කොට විකිණීමේ ක්‍රමය'' මගින් හඳුන්වා ඇත්තේ,

1 අලෙවිකරණයයි.
2. සම්බන්ධතා අලෙවිකරණයයි.
3. සමාජ වගකීම් අලෙවිකරණයයි.
4. ඍජු අලෙවිකරණයයි.
5. පෞද්ගලික අලෙවියයි. (.....)

27. කොළඹ කොටස් හුවමාරුව යනු,

1. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හඳුන්වන තවත් නමකි.
2. කොටසින් සීමිත සමාගමකි.
3. ලැයිස්තුත සමාගම්වල කොටස් මිලට ගැනීම් හා විකිණීම් පරිපාලනය කරනු ලබන ආයතනයකි.
4. රජයේ සුරැකුම්පත් ගණුදෙනු කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයකි.
5. පෞද්ගලික හා පොදු සමාගම්වල කොටස් නියාමනය කරන ආයතනයකි. (.....)

28. ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය (ATS) මගින් ලබාදෙන සේවාවක් නොවන්නේ,

1. ගණුදෙනු ඉක්මනින් පියවීම.
2. විකුණු කොටස් සංඛ්‍යාව හා එහි අගයයන් දක්වීම.
3. අන්තර්ජාලය හරහා මිල දර්ශක ඉදිරිපත් කිරීම.
4. ගණුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.
5. ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තොරතුරු සැපයීම. (.....)

29. මිලංකා හා මිල දර්ශකය වෙනුවට හඳුන්වා දී ඇති මිල දර්ශකය වනුයේ,

1. සියළු කොටස් මිල දර්ශකය
2. සමස්ථ ආදායම් දර්ශකය
3. නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය
4. S&P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය
5. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (.....)

30. මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයට අයත් කාර්යන් දක්වෙන කාණ්ඩය තෝරන්න.

1. ආකර්ෂණය හා තෝරාගැනීම/පුහුණුව හා සංවර්ධනය/සුභසාධනය
2. ආකාර්ෂණය හා තෝරාගැනීම / පුහුණුව හ සංවර්ධනය / වැටුප් ගෙවීම.
3. ආකර්ෂණය හා තෝරාගැනීම / ස්ථාන මාරු කිරීම / වැටුප් ගෙවීම
4. උසස්වීම් ලබාදීම / වැටුප් ගෙවීම් / ස්ථාන මාරු ලබාදීම.
5. සේවයෙන් පහ කිරීම / ආකර්ෂණය හා තෝරා ගැනීම / වැටුප් ගෙවීම. (.....)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. (අ) ව්‍යාපාර = ........................................ + ................................ + උපකාරක සේවා

(ආ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වර්තාවට අනුව කාර්මික අංශය 1. ............................................................... 2. නිෂ්පාදන කර්මාන්ත 3. .................................................... සහ 4. විදුලිය ගෑස් හා ජලය යන අංශයන්ගෙන් සමන්විත වේ.

32. පරිසරය ආරක්ෂා කරමින්, සේවක දක්‍ෂතා වර්ධනය කරමින්, ව්‍යාපාර ප්‍රගතියට අදාළ ව්‍යාපාර රාමුවක් නිර්මාණය කිරීම.

අ). ........................................................................... වන අතර ආ) හරිදෙයට එරෙහිව වැරදි දෑ සම්බන්ධ මූලධර්ම හා ප්‍රමිති සම්බන්ධ අවධානය යොමුකරනු ලබන්නේ .................................................................. මගිනි.

33. ජාතික රූපවාහිනිය වැනි ආයතන තුළින් අනෙකුත් රූපවාහිනී නාලිකා වලට රජය .......................................... .......................................... ලෙස කටයුතු කරනු ලබන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි ආයතන බිහිකිරීම තුළින් රජය ................................................................................ ලෙස ව්‍යාපාර වලට බලපෑම් ඇතිකරයි.

34. (අ) කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳ නිෂ්පාදනය, සේවය හෝ විකිණීම පිළිබඳ සමාගමක් සතු අයිතිය වෙනත් ව්‍යාපාරයකට පැවරීම .......................................................................... ලෙස හැඳින්වේ.

(ආ) ගානර් එදිරිව මරේ නඩුතීන්දුවට අනුව බංකොලොත් හවුල් කරුවකුගේ අලාභ කොටස බංකොලොත් නොවූ හවුල්කරුවන් අතර .................................................................... බෙදිය යුතුය.

35. (අ) ........................................................... සහ ....................................................... යනු රජය විසින් කුඩා ව්‍යාපාර සංවර්ධනය සඳහා සපයන මූල්‍යමය නොවන දිරිගැන්වීම් දෙකකි.

(ආ) ...................................................... සහ ...................................................... යනු රජය විසින් කුඩා කර්මාන්ත සංවර්ධන සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති 2කි.

36. මෙමෝ පත්‍රය ................................................................ ලිඛිත සන්නිවේදන ක්‍රමයක් වන අතර ඉන්ටර්කොම් අභ්‍යන්තර ............................................................... සන්නිවේදන ක්‍රමයකි.


37. (අ) සංවිධාන පරිසරයේ පවත්නා සත්‍ය තත්ත්වයන් තේරුම්ගෙන ඒවාට ප්‍රතිචාර දක්වීමට යොදාගන්නා පාලන ක්‍රමය හඳුන්වන්නේ ........................................................... පාලනය ලෙසය. සේවක කාර්ය සාධන ඇගයීම් ඇතුළත් කළ හැකි. පාලන ක්‍රමය හඳුන්වන්නේ ....................................................................... ලෙසය.

(ආ) බලතල ස්ථාපිත වී ඇති ආකාරය අනුව සංවිධානයක් ................................................................................ හා ........................................................................ වශයෙන් වර්ග කළ හැකිය.

38. (අ) මොරගහකන්ද වැනි ජල යෝජනා ක්‍රම සැකසීමට යෝග්‍ය වන්නේ ............................................................ පිරියත ක්‍රමයයි.

(ආ) මෙහෙයුම් කළමණාකරණය පාඩමට අදාළව සිසුන් සඳහා ටියුට් 1000 ක් මුද්‍රණය කිරීම ...................................................................... නිෂ්පාදනයයි.

39. (අ) කාර්මික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග දැක්වෙන පහත සටහනේ හිස්තැන්වලට සුදුසු පද යොදන්න.




(ආ) ව්‍යාපාර ආයතනයේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ................................ .................................... උපායමාර්ග ................................................................................................ යනුවෙන් හඳුන්වයි.

40. (අ) ..................................................... සහ ..................................................... යනු කොටස් වෙළඳපොළ දර්ශකවලින් ලබාගත හැකි ප්‍රයෝජන 2කි.

(ආ) ..................................................... සහ ..................................................... යනු කොළඹ කොටස් හුවමාරුවේ ගණුදෙනුවන උපකරණ 2කි.

- **අංක 41 සිට 50 දක්වා ප්‍රශ්න වලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට බලපෑම් කරන විවිධ පරිසර බලවේග කීපයකි. ඒවා අයත් වන්නා වූ පරිසර සාධකය හා ඉන් ව්‍යාපාරයකට අත්වන්නාවූ ප්‍රයෝජන හිස්තැන්වල ලියා දක්වන්න.

| බලවේගය | පරිසර සාධකය | ප්‍රයෝජන |
|---|---|---|
| 1. ව්‍යාපාරයේ සංවිධාන සංස්කෘතිය යහපත් වීම. | ........................................... | ........................................... |
| 2. ආදේශක භාණ්ඩ නිපදවන්නන් බහුලවීම | ........................................... | ........................................... |
| 3. කළමනාකරුවන්ගේ අයහපත් තීරණ | ........................................... | ........................................... |
| 4. ලෝක වෙළඳපලේ තිරිඟුපිටි මිල ඉහළයාම හා සහල් පිටි ආශ්‍රිත කර්මාන්තවලට රජය සහන ලබාදීම. | ........................................... | ........................................... |

42. ව්‍යාපාර රජයේ අරමුණු ඉටුකිරීමට දායකවන ආකාර 4ක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

43. පැවරුම්කරුගේ අයිතියෙහි දෝෂ පැවතුනහොත් පැවරුම්ලාභියාගේ හිමිකම්ද දෝෂ සහිත වේ. මෙම අදහස ඇතුළත්වීම සඳහා රේඛණයක් තුළ සඳහන් කළයුතු යෙදුම කුමක්ද?

..........................................................................................

44. රක්‍ෂණ මූලධර්ම 4ක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

45. උචිත ප්‍රවාහන ක්‍රමයක් තේරීමේදී සලකා බලනු ලබන කරුණු 4ක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

46. විදේශ වෙළඳාමේ උන්නතිය උදෙසා ක්‍රියාකරනු ලබන ආයතන 4ක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

47. හෙන්ඞ්‍රි මින්ස්බර්ගේ වර්ගීකරණයට අනුව කළමනාකරුවකු විසින් ඉටුකළයුතු තීරණ භූමිකාවන්ට අයත් කාර්යයන් හතර නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

48. සන්නම්කරණයේදී භාවිතාකරන විවිධ සන්නම් වර්ග හතරක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

49. කෙටිකාලීන ආයෝජන තීරණ 4ක් නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

50. රැකියා විග්‍රහයේදී (විශ්ලේෂණයේදී) මානව සම්පත් කළමනාකරු සතු තොරතුරු පද්ධතිය මූලික ලියවිලි දෙකකින් යුක්ත වේ. ඒවා නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 32 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ............................ **ව්‍යාපාර අධ්‍යයනය II** කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) (අ) ව්‍යාපාරවල සාර්ථකත්වය ඇල්මැති පාර්ශවයන් තෘප්තිමත් කිරීම මත රඳ පවතින්නේ යැයි ප්‍රකාශවේ. පහදන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක් අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීමට හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) වෙළඳපොළ, වෙළඳපොළ ස්ථානය, වෙළඳපොළ අවකාශය යන සංකල්ප විස්තර කරන්න.(ලකුණු 2)

(ආ) කාර්මික භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ අතර වෙනස්කම් 4ක් ලියන්න. (ලකුණු 2)

(iii) එක්තරා වර්ෂයක ශ්‍රී ලංකවේ දළ දේශීය නිෂ්පාදිතය ආශ්‍රිත දත්ත පහතින් දක්වේ. (මිලියන වලින්)

| | |
|---|---|
| කෘෂිකර්මය | 175 |
| දැව හා වන කර්මාන්තය | 80 |
| ධීවර කර්මාන්තය | 70 |
| ප්‍රවාහනය | 64 |
| රාජ්‍ය සේවා | 92 |
| නිමවුම් කර්මාන්ත | 280 |
| පතල් කර්මාන්තය | 92 |
| තොග හා සිල්ලර වෙළඳාම | 100 |

(අ) ප්‍රාථමික අංශයේ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 1)

(ආ) ද්විතියික අංශයේ වටිනාකම ගණනනය කරන්න. (ලකුණු 1)

(ඇ) තෘතීක අංශයේ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 1)

(ඉ) කෘෂිකාර්මික අංශයේ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 1)

(iv) ''සදීපා'' පාවහන් නිෂ්පාදකයා වෙළඳපොළ ජයගත් සාර්ථක ව්‍යාපාරිකයෙකි. එයට ප්‍රධාන හේතුව ඔහු තම ව්‍යාපාරයේ පරිසරය පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කිරීමයි.

(අ) ඔහු විසින් අවධානය යොමුකළ පරිසර සාධක නම් කරන්න. (ලකුණු 2)

(ආ) ඔබ නම්කල පරිසර සාධක 2ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(v) සමාජය තුළ ධනාත්මක බලපෑම් ජනිත කිරීම සඳහා ව්‍යාපාර ක්‍රියාවලිය නිවැරදිව කළමණාකරණය කිරීම ව්‍යාපාරයක සමාජ වගකීමකි.

(අ) මේ සඳහා ව්‍යාපාරයක් අවධානය යොමුකළ යුතු පාර්ශව 4ක් නම්කර එම පාර්ශවයන් සඳහා ඉටුවිය යුතු සමාජ වගකීම් 1 බැගින් ලියන්න. (ලකුණු 2)

(ආ) වර්තමානයේ ඕනෑම ව්‍යාපාරයක් ආචාරධර්ම පද්ධතියක් තුළ ක්‍රියාත්මක වීමෙන් හා ඒ පිළිබඳ අවධානයකින් කටයුතු කිරීමෙන් තරඟකාරිත්වය සාර්ථකව ජයගනී.
''ව්‍යාපාර ආචාරධර්ම'' සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

02. (i) ව්‍යාපාරයක් පවතින නීතිරීති වලට අනුව කටයුතු කිරීම, සත්‍යවාදී වීම, අවංක වීම, සාධාරණ වීම යනාදී ආචාරධර්ම වලට අනුව කටයුතු කිරීම මගින් ඉහළ ප්‍රතිලාභ අත්කර ගනී. මෙහිදී ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක අනුව කටයුතු කරන අතර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත්වියයුතු කරුණු 4ක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) සෑම ආර්ථිකයකම ප්‍රධාන ආර්ථික අරමුණු වශයෙන් සැලකෙන පූර්ණ සේවා නියුක්තිය හා ආර්ථික වර්ධනය යන අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තියේ හා මූල්‍ය ප්‍රතිපත්තියේ මූලික අරමුණු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (අ) පහත සඳහන් බදු වර්ග ඍජු හා වක්‍ර වශයෙන් බෙදා වෙන්කර දක්වන්න.
රේගු බදු, ප්‍රාග්ධන ලාභ බදු, සමාගම් බදු, නිෂ්පාදන බදු, ආදායම් බදු, VAT (ලකුණු 2)

(ආ) පාරිභෝගික වගකීම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) (අ) අනෙකුත් ව්‍යාපාර හා සසඳන කළ කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි ධනාත්මක ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) 1890 හවුල් ආඥා පණතේ සඳහන් පරිදි හවුල් ව්‍යාපාරයක් යන්න අර්ථ දක්වන්න. (ලකුණු 2)

(v) සුනිමල් තමා විසින් පවත්වාගෙන ගිය සිල්ලර බඩු වෙළඳ සැල තම සහෝදරයා වූ නිමල් සමඟ එකතු වී සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස පිහිටුවීමට තීරණය කරන ලදී.

(අ) සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත්කළ යුතු ලියවිලි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ඉහත සඳහන් ව්‍යාපාරය සීමාසහිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි නොකොට සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් සුනිමල් ට හා නිමල්ට අත්වන වාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

03. (i) (අ) සීමාසහිත පොදු සමාගමක් හා සමුපකාරයක් අතර අසමාන ලක්ෂණ 4ක් ලියන්න. (ලකුණ 2)

(ආ) ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය මත පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු අංශයේ ව්‍යාපාර වශයෙන් කොටස් දෙකකට බෙදේ. රජය සමහර ව්‍යාපාර පොදු හිමිකාරිත්වය යටතේ රාජ්‍ය අංශය සතුව පවත්වා ගනී. එසේ සමහර ව්‍යාපාර රජය යටතේ පවත්වාගෙන යාමට හේතුවන කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) සමාජ ව්‍යවසායකත්වය පිළිබඳ මේ දිනවල බොහෝ ජනමාධ්‍ය ආයතන තුළින් පවා කතාබහට ලක්වේ. සමාජ ව්‍යවසායකයන් පිළිබඳ කථාබස් කෙරෙන ඇත් පවුර වැනි වැඩසටහන් ඊට උදාහරණ වේ. සමාජ ව්‍යවසාය යනු කුමක්දැයි ඔබේ වචනයෙන් දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකත්වය රටක සංවර්ධනයට බෙහෙවින් වැදගත්වන සාධකයකි. ව්‍යවසායකත්වයේ වැදගත්කම පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

(iii) ඔබ දියවැඩියා රෝගීන්ට පැළඳීමට සුදුසු සෞඛාරක්ෂිත පාවහන් යුගලක් නිර්මාණය කළේයැයි සිතන්න. එම අදහස ඔබගේ සිතට පැමිණි අවස්ථාවේ සිට ලාභ ලබන ව්‍යාපාරයක් දක්වා එම නිෂ්පාදිතය වර්ධනය කරගැනීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්ව ක්‍රියාවලිය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) මුදලේ කාර්යයන් සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා මුදල් තුළ අන්තර්ගත වියයුතු හොඳ මුදලක කැපී පෙනෙන ලක්ෂණ 4ක් දක්වා එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ධාරක චෙක්පත හා විධාන චෙක්පත යන්න කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු පොලී අනුපාතිකය යන්න කුමක්දැයි හඳුන්වා එය පහත දැමීමෙන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ඇතිවන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

04. (i) (අ) රක්ෂණයේදී 'අවදානම' යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) රක්ෂණ ගිවිසුමක් වලංගුවීම සඳහා තිබිය යුතු මූලිකාංග 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) ගිනි රක්ෂණයක් යටතේ ජලගැලීම් වලින් සිදුවන හානි සඳහා වන්දි ලබාගතහැකිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) පණිවිඩයක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (අ) සඵලදායී සන්නිවේදනයට ඇති බාධාවන් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) සිල්ලර වෙළෙන්දාගෙන් නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට සැළසෙන වාසි (සේවා) 2 බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)
(iv) (අ) බැඳි වෙළෙඳසැල් සංකල්පය හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) අන්තරාල වෙළඳාම හා ප්‍රති අපනයන අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)
(v) විදේශ වෙළඳාමට පවතින බාධා වර්ග කර දක්වා නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

## II කොටස

05. (i) "Robert Katz විසින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව කළමනාකරුවන්ට අවශ්‍ය කුසලතා වර්ග 3ක් හඳුන්වන ලදී.''
(අ) Robert Katz විසින් හඳුන්වාදෙන ලද කළමනාකාරිත්ව කුසලතා සහ එම කුසලතා වඩා වැදගත්වන කළමනාකරණ මට්ටම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) අඩු අභිප්‍රේරණයක ලක්ෂණ (Symptoms of low motivation) හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ii) (අ) හොඳ නායකත්වයක් සඳහා කළමනාකරුවෙකු සතු විය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) සංවිධාන ව්‍යුහයකින් නිරූපණය වන දෑ හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(iii) (අ) දුර්වල සන්නිවේදන ක්‍රම නිසා ව්‍යාපාර ආයතනවලට මුහුණපෑමට සිදුවන ගැටලු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) පටුපාලක පරාසයක වාසි 4ක් දක්වන්න. (ලකුණු 2)
(iv) පාලනයෙහි කාල තුන (Three time period of control) නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)
(v) නිෂ්පාදන ආයතනයක ව්‍යාපාරික හා පාරිභෝගික අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුවීමට නිෂ්පාදනය කළමනාකරණයකින් යුතුව සිදුකිරීම ඉතා වැදගත් වේ.
(අ) ඉහත ප්‍රකාශයෙන් අර්ථවත්වන ආකාරයට නිෂ්පාදන කළමණාකරණය යන්න අර්ථ දක්වන්න. (ලකුණු 2)
(ආ) නිෂ්පාදන කළමණාකරුවෙකු විසින් අවධානය යොමුකරන මෙහෙයුම් කළමණාකරණ කාර්යන් අතර නිෂ්පාදන පාලනය වඩා වැදගත්වේ. මෙහිදී නිෂ්පාදන සැලසුම්කරණ ඉලක්ක ලඟාකරගැනීමට ඔහු විසින් අවධානය යොමුකරන නිෂ්පාදන පාලන ක්ෂේත්‍ර 4ක් නම්කරන්න. (ලකුණු 2)

06. (i) මෙහෙයුම් ක්‍රියාවලිය සටහනක් මගින් දක්වන්න. එමගින් යෙදවුම්වලට වටිනාකමක් එකතුවෙමින් නිෂ්පාදනයේ වටිනාකම වැඩිවේ. උදාහරණ සහිතව එම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4)
(ii) (අ) නිෂ්පාදනයක් සඳහා ක්‍රමයක් තෝරා ගැනීමෙන් පසු නිෂ්පාදනය කාර්යක්ෂමතාවයෙන් යුතුව සිදුකිරීමට පිරියත සැලසුම් කිරීම වඩා වැදගත්වේ. ඔබට හැගෙන ආකාරයට නිෂ්පාදිත හෙවත් මෙහෙයම් පිරියත සැලැස්ම අර්ථ දක්වන්න. (ලකුණු 2)
(ආ) නිෂ්පාදිත පිරියත සැලැස්මක වාසි 4 දක්වන්න. (ලකුණු 2)
(iii) (අ) X නැමැති ව්‍යාපාර ආයතනයේ තොග මට්ටම් නිශ්චය කිරීමට අදාළ තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| අවම ද්‍රව්‍ය පාරිභෝජනය | - දිනකට ඒකක 80 |
| උපරිම ද්‍රව්‍ය පාරිභෝජනය | - දිනකට ඒකක 120 |
| යලි ඇනවුම් ප්‍රමාණය | - ඒකක 4800 |
| යලි ඇනවුම් කාලය | - අවම දින 20, උපරිම දින 30 |

ඉහත තොරතුරු ඇසුරින් යළි ඇනවුම් මට්ටම හා අවම තොග මට්ටම ගණනය කරන්න.(ලකුණු 2)
(ආ) ඵලදායී තාවය කිසියම් නිමවුමක කාර්යක්ෂමතාවය මැනීමේ වැදගත් මිනුම් දණ්ඩකි.
ඵලදායීතාවය අර්ථ දක්වන්න. ඵලදායීතාවය වර්ධනය හා පිරිහීම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) (අ) අලෙවිකරණය යනු ''පුද්ගලයන්ගේ හා ආයතන වල අශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා යොමු වූ සමාජයීය හා කළමනාකරණ ක්‍රියාවලියක් වේ.'' අලෙවිකරණය පිළිබඳව සමාජයීය දෘෂ්ඨිකෝණයෙන් ඉදිරිපත් වී ඇති නිර්වචනය සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) අලෙවි කළමනාකරණය තුළ භාවිත වන අලෙවිකරණ දර්ශන කාලානුරූපව වෙනස් වූ ආකාරය අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) වෙළඳපොළ ඛණ්ඩනය යනු කුමක්දැයි පැහැදිලිකර වෙළඳපොළක් ඛණ්ඩනය කළ හැකි පදනම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ''භාණ්ඩ අලෙවිකරණ මිශ්‍රයට වඩා සේවා අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් අභියෝගාත්මකව බව ප්‍රකාශ වේ.'' සේවා අලෙවිකරණ මිශ්‍රයට අයත් සියළු විචල්‍යයන් සඳහන් කරන්න. (ලකුණු 2)

07. (i) (අ) ''අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් අතුරින් අලෙවි කළමනාකරුවකුට මිල මිශ්‍රය ඉතා වැදගත් වේ.'' මිල යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි අර්ථ දක්වා අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් අතුරින් මිල මිශ්‍රය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මිල කිරීමේ ශිල්පීය ක්‍රම අතුරින් පිරිවැය පදනම් කරගත් හා ඉල්ලුම පදනම් කරගත් ශිල්පීය ක්‍රම දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) ඇසුමරුමකින් භාණ්ඩයකට ආරක්ෂාවක් ලබාදෙනවා සේම වර්තමානයේ එය අලෙවිකරණ උපකරණයක් ලෙසද භාවිතා කරයි.'' ඇසුරුම්කරණය හා ඇසුරුම අර්ථ දක්වා ඇසුරුමක් නිර්මාණය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු 8ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (අ) ''අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණයක් ලෙස ප්‍රචාරණය හැඳින්වේ.'' ප්‍රචාරණයේ අරමුණු 4ක් නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ''විකුණුම් ප්‍රවර්ධනය'' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි හඳුන්වා විකුණුම් ප්‍රවර්ධනය සඳහා යොදාගන්නා ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) (අ) ඉසුරු මුල්‍ය කළමණාකරණ උපාධියක් හදාරා ඇති අතර ඔහු ප්‍රසිද්ධ ආයතනයක මුල්‍ය කළමණාකරු වශයෙන් රැකියාව කිරීම සඳහා අදාළ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් විය. සම්මුඛ පරීක්ෂණයේදී ඔහුගෙන් ඇසූ එක් ප්‍රශ්නයක් නම් මුල්‍ය කළමණාකරණයේ ප්‍රධාන අරමුණ කමක්ද යන්න හා අතිරේක අරමුණු මොනවාද යන්නයි. ඔබට හැඟෙන පරිදි මුල්‍ය කළමණාකරණයේ ප්‍රධාන අරමුණු හා අතිරේක අරමුණු මොනවාද? (ලකුණු 2)

(ආ) මුල්‍ය කළමණාකරණයේදී ගනු ලබන ප්‍රධාන තීරණ වර්ග දෙක මොනවාද? ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) බොහෝ ආයතන මුල්‍ය වර්ෂයක් ආරම්භ වීමට පළමුව මුදල් අයවැය ලේඛණයක් පිළියෙළ කරයි. ඉන් ආයතනයකට ලැබෙන ප්‍රයෝජන මොනවාද? (ලකුණු 2)

(ආ) ආයතනයක අරමුදල් අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. ඒ මොනවාද? උදාහරණ 2 බැගින් දක්වන්න. (ලකුණු 2)

08. (i) (අ) ව්‍යාපාරයක මුල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේදී බොහෝ කරුණු පිළිබඳව සැලකිලිමත් වියයුතුය. එම කරුණු කිහිපයක් (5ක් පමණ) පෙන්වන්න. (ලකුණු 2)

(ආ) ද්‍රවශීලත අනුපාතයකින් පෙන්වනුයේ කුමක්ද? ද්‍රවශීල අනුපාත 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) (අ) ක්‍රියාකාරී අනුපාතය යනු කුමක්ද? ඊට උදාහරණ 2ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) දිගුකාලීන ආයෝජන තීරණ මොනවාද? එම තීරණ ගැනීමේදී සලකා බලන කරුණු මොනවාද? (ලකුණු 2)

(iii) මුල්‍ය වෙළඳපොළ යන යෙදුම ඔබ නිතර නිතර අසා පුරුදු යෙදුමකි. මුල්‍ය වෙළඳපොළ යනු කුමක්ද? එම වෙළඳපොළට අයත් උප වෙළඳපළවල් මොනවාද? (ලකුණු 4)

(iv) (අ) ව්‍යාපාර කටයුතු සඳහා යොදාගන්නා සම්පත් අතුරින් ඉතා වටිනා මෙන්ම අත්‍යවශ්‍ය සම්පතක් වනුයේ මානව සම්පතයි. අනෙකුත් සම්පත්වලට වඩා මානව සම්පතෙහි දක්නට ඇති විශේෂිත ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) මානව සම්පත් කළමණාකරණයේදී තනතුරු සඳහා අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම අනුගමනය කිරීමේදී ඇතිවන අවාසිදායක තත්වයන් 4ක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) ආයතනයක මානව සම්පත් සැලසුම්කරණය යන්නෙන් හඳුන්වනුයේ කුමක්ද? (ලකුණු 1)

(ආ) ආයතනයක අනාගත මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේදී සලකා බලනු ලබන කරුණු 06ක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 3)

# දෙවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 01) | - 4 | (11) | - 2 | (21) | - 5 |
| (02) | - 3 | (12) | - 3 | (22) | - 5 |
| (03) | - 5 | (13) | - 4 | (23) | - 3 |
| (04) | - 2 | (14) | - 1 | (24) | - 4 |
| (05) | - 4 | (15) | - 4 | (25) | - 3 |
| (06) | - 3 | (16) | - 5 | (26) | - 5 |
| (07) | - 2 | (17) | - 1 | (27) | - 3 |
| (08) | - 5 | (18) | - 4 | (28) | - 5 |
| (09) | - 2 | (19) | - 4 | (29) | - 4 |
| (10) | - 3 | (20) | - 1 | (30) | - 1 |

31. (අ) කර්මාන්ත, වෙළඳම (ආ) පතල් හා කැණීම්, ඉදිකිරීම්
32. (අ) සමාජ වගකීම (ආ) ආචාරධර්ම
33. තරගකරුවෙකු, බදු අයකරන්නෙකු
34. (අ) වරලත් ව්‍යාපාරයක් (ආ) අවසාන ප්‍රාග්ධන අනුපාතය
35. (අ) උපදේශන සේවා, යටිතල පහසුකම් (ආ) සුචන, සහනයා
36. අභ්‍යන්තර, වාචික
37. (අ) උපක්‍රමික පාලනය, මෙහෙයුම් පාලනය (පසු පෝෂණ පාලනය) (ආ) මධ්‍යගත, විමධ්‍යගත
38. (අ) ස්ථාවර ස්ථානීය පිරියත. (ආ) කාණ්ඩ නිෂ්පාදනය
39. (අ) A - කාර්මික භාණ්ඩ බෙදාහරින්නා (ආ) අලෙවිකරණ, අලෙවිකරණ මිශ්‍රය
    B - නිෂ්පාදකයාගේ නියෝජිතයා C - කාර්මික භාණ්ඩ බෙදාහරින්නා.
40. (අ) 1. ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව දැන ගැනීමට
    2. රට රටවල් අතර කොටස් වෙළඳපොළ සැසඳීමට
    (ආ) සාමාන්‍ය කොටස්, වරණීය කොටස්
41. 1. අභ්‍යන්තර - ශක්තීන් 2. ආසන්න - තර්ජන
    3. අභ්‍යන්තර - දුර්වලතා 4. සාර්ව - අවස්ථා
42. 1. බදු ගෙවීම 2. රජයේ නීති රීති හා ප්‍රතිපත්ති පිළිපැදීම
    3. සේවා නියුක්තියට දායක වීම. 4. දේශීය සම්පත් භාවිතය
    5. පරිසර හානි අවම කිරීම.
43. ''ගනුදෙනු කළ නොහැකිය'' යන යෙදුම
44. 1. රක්ෂණ හිමිකම 2. හානි පූර්ණය 3. උපරිම විශ්වාසය
    4. දායකත්වය 5. ආදේශනය 6. ආසන්නතම හේතුව
45. 1. භාණ්ඩයේ ස්වභාවය. 2. දුර 3. වේගවත් බව
    4. සුරක්ෂිත බව 5. පිරිවැය 6. ධාරිතාවය
    7. සුලභතාවය 8. ප්‍රමිතීන් හා අන්තර්ජාතික සම්මත
46. 1. ලෝක වෙළඳ සංවිධානය 2. ලෝක බැංකුව
    3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 4. G - 8 කණ්ඩායම 5. පිළිගත හැකි වෙනත්
47. 1. සාකච්ඡාකර එකඟතාවකට පත්වන නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.
    2. සම්පත් බෙදා හරින්නකු ලෙස කටයුතු කිරීම.
    3. ගැටුම් සමනය කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
    4. ව්‍යවසායකයකු ලෙස කටයුතු කිරීම.
48. 1. ජාතික සන්නම 2.පෞද්ගලික සන්නම 3. පවුල් සන්නම 4. භාණ්ඩ සන්නම
49. 1. මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
    2. ණය ගැතියන් පිළිබඳ තීරණ
    3. වෙළඳ තොගය පිළිබඳ තීරණ
    4. අනෙකුත් කෙටිකාලීන ආයෝජන පිළිබඳ තීරණ
50. රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය.

## දෙවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
## II පත්‍රය

01. (i) (අ) සෑම ව්‍යාපාරයක් කෙරෙහිම එහි කටයුතු මෙහෙයවා පැවැත්වමේ දී අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, වෘත්තීය සමිති යනාදී වශයෙන් බොහෝ පාර්ශව ඇල්ම දක්වයි. මේ සෑම පාර්ශවයක්ම ව්‍යාපාරයෙන් නිශ්චිත ප්‍රතිලාභයක් අපේක්ෂා කරයි. මෙම ප්‍රතිලාභ ඔවුනට ලබාදීමට උත්සාහ කිරීම තුළින් මෙම ඇල්මැති පාර්ශව සතුටට පත්වීම හේතුකොටගෙන ඔවුන් තම උපරිම දායකත්වය ව්‍යාපාරයට ලබාදීම හේතුකොටගෙන ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය ඇතිවේ.

(ආ) 1. ව්‍යාපාරය මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂිත දේ කුමක්ද යන්න සංවිධානයේ සියලු දෙනාටම පැහැදිලි කිරීම. 2. ව්‍යාපාරයේ මානව හා භෞතික සම්පත් ඵලදායී ලෙස සංවිධානය කිරීමට කළමනාකරුවන්ට අවස්ථාව ලබාදීම. 3. කළමණාකරුවන්ට හා සේවකයන්ට ඔවුන්ගේ කටයුතු සංවිධානය කරගැනීමේදී පහසුවක් ඇතිකිරීම. 4. විශ්වාසයෙන් යුතුව ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේ අවස්ථාව ලබාදීම. 5. පරිසරයේ ඇති අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ හැකියාව ලබාදීම. 6. සේවකයින් අභිප්‍රේරණය කිරීම.

(ii) (අ) <u>වෙළෙඳපොළ -</u> අවශ්‍යතා සපුරන භාණ්ඩ හා සේවා හුවමාරු කරගැනීමට ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන ඕනෑම ස්ථානයක් හෝ අවස්ථාවක් වෙළෙඳපොළ නම් වේ.

<u>වෙළෙඳපොළ ස්ථානය -</u> භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමට ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුහුණට මුහුණ හමුවීමේදී ගොඩනැගෙන වෙළෙඳපොළයි.

<u>වෙළෙඳපොළ අවකාශය :</u> වර්තමානයේ පරිගණක හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගෙන විද්‍යුත් වාණිජමය ගනුදෙනු සිදු කිරීමේදී ගොඩනැගෙන පුළුල් වෙළෙඳපොළ ස්වභාවය වෙළෙඳපොළ අවකාශය යි.

(ආ)

| පාරිභෝගික භාණ්ඩ | කාර්මික භාණ්ඩ |
|---|---|
| 1. සාමාන්‍ය පාරිභෝගිකයන් පරිභෝජනයට ගනී. | ව්‍යාපාරවල ප්‍රයෝජනයට ගනී. |
| 2. සෘජු ඉල්ලුමක් ඇත. | ව්‍යුත්පන්න ඉල්ලුමක් ඇත. |
| 3 එදිනෙදා පරිභෝජනයට යොදාගනී. | නිෂ්පාදන කාර්යයන්ට යොදාගනී. |
| 4. කෙටි ජීවකාල පැවැත්මක් ඇත. | දිගු ජීවකාල පැවැත්මක් ඇත. |

(iii) (අ) ප්‍රාථමික අංශයේ වටිනාකම :

| | | |
|---|---|---|
| කෘෂි | = | 175 |
| දැව හා වන | = | 80 |
| ධීවර | = | 70 |
| පතල් | = | 92 |
| | = | 417 |

(ආ) ද්විතික අංශයේ වටිනාකම - නිමැවුම් = 280

(ඇ) තෘතික අංශයේ වටිනාකම -

| | | |
|---|---|---|
| තොග හා සිල්ලර | = | 100 |
| රාජ්‍ය සේවා | = | 92 |
| ප්‍රවාහනය | = | 64 |
| | = | 256 |

(ඉ) කෘෂිකාර්මික අංශයේ වටිනාකම -

| | | |
|---|---|---|
| කෘෂි | = | 175 |
| වන හා දැව | = | 80 |
| ධීවර | = | 70 |
| | = | 325 |

(iv) (අ) අභ්‍යන්තර, ආසන්න, සාර්ව

(කරුණු 3නම් කර ඇත්නම් ලකුණු 2, 2ක් නම්කර ඇත්නම් ලකුණු 1, එකකට ලකුණු හිමි නොවේ)

(ආ) <u>අභ්‍යන්තර පරිසරය :</u> ව්‍යාපාරික ආයතනයක් හෝ සංවිධානයක් තුළ සිටින ඊට බලපෑම් කරන්නාවූ කණ්ඩායම් හා තත්ත්වයන්ය. උදා : අයිතිකරු, කළමණාකරු, සේවකයන්, සංවිධාන ව්‍යුහය සංවිධාන සංස්කෘතිය.

<u>ආසන්න පරිසරය :</u> ව්‍යාපාරයකට හෝ සංවිධානයකට බලපෑම් කරන්නාවූ සුවිශේෂ සංවිධාන හෝ කණ්ඩායම් වේ. උදා : ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරගකරුවන්, ආදේශ භාණ්ඩ නිපදවන්නන්, විභව ආයෝජකයන්.

<u>සාර්ව පරිසරය :</u> ව්‍යාපාරයක හෝ සංවිධානයක පුළුල් වටපිටාය හා ඒ හා බැඳුනු බලපෑම්කරන කණ්ඩායම් සාර්ව පරිසරයයි. උදා : ආර්ථික, දේශපාලන හා නෛතික, තාක්ෂණ, ප්‍රජා, සමාජ සංස්කෘතික, ගෝලීය ස්වභාවික.(සම්පූර්ණ විස්තර උදාහරණ සහිතව කරුණු 2කම විස්කර කර ඇත්නම් ලකුණු 2)

(v) (අ) සේවකයන්, අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සමාජය.

සේවකයන් : සමානාත්මතාවයෙන් සැලකීම, වෘත්තීමය ආරක්ෂාව, සෞඛ්‍යය පහසුකම් ලබාදීම, පිළිගැනීම , මනා සේව්‍ය සේවක සම්බන්ධතා.

අයිතිකරුවන් : අවංකව හා කාර්යක්ෂමව කළමනනාකරණ කටයුතු සිදුකිරීම, ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ අත්කරදීම, සාධාරණ ඉපයීමක් ලබාදීම.

ගනුදෙනුකරුවන් : සාධාරණව ඔවන්ට සේවය සැපයීම, ආරක්ෂාව සැලකීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

සමාජය : ප්‍රජාසත්කාර සේවා, අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් බදුගෙවීම, සේවා නියුක්තියට දායක වීම. (4 ම නම්කර ඇත්නම් උදාහරණ එක බැගින් දක්වා ඇත්නම් 1 කරුණකට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක් තම කටයුතුකරගෙන යාමේදී තමාටත් සෙසු පාර්ශවයන්ටත් පුළුල් වශයෙන් සමාජයටත් යහපතක් සැලසෙන අයුරින් කටයුතු කිරීමයි. නැතහොත් හොඳ නරක පිළිබඳ මනා වැටහීමකින් ව්‍යාපාර කටයුතු කිරීමයි. (විස්තරාත්මක පිළිතුරට ලකුණු 2)

02. (i) ව්‍යාපාරය, ගනුදෙනුකරු, සේවකයා, තරගකරුවන්, සමාජ සංස්කෘතිය, සංවිධාන සංස්කෘතිය, ප්‍රායෝගිත බව.

ව්‍යාපාරය : ව්‍යාපාරයේ ස්වභාවය, නිෂ්පාදන ව්‍යාපාරයේ ස්වභාවය, සුළු පරිමාණද, මහා පරිමාණද යන්න.

ගණුදෙනුකරු - ඔහුගේ ඉල්ලුම් රටා ඔහුගේ සමාජ හා සංස්කෘතියට අදාළ කරුණු.

සේවකයා - සේවකයාගේ පරිසර තත්වයන් ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා පිළිඳ හා සේවකයා කුමන මට්ටමේ සේවකයෙක්ද යන්න.

තරගකරු - තරගකරුවන් පිළිබඳ තොරතුරු තරගකරුවන් අනුගමනය කරන ක්‍රියාමාර්ග හා ආචාරධර්ම පිළිබඳ තොරතුරු.

සමාජ සංස්කෘතිය - ජන වර්ග ඔවුන්ගේ උපසංස්කෘතීන් අගනාකම් සාරධර්ම ආදිය.

ප්‍රායෝගික බව - ආචාර ධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇද්ද, නැද්ද යන වග.

(කරුණු 4නම්කර විස්තර කිරීමට ලකුණු 4, නම්කිරීමට පමණක් නම් එක් කරුණකට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(ii) (අ) පූර්ණ සේවා නියුක්තිය යනු ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සාධක පූර්ණ ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගැනීමයි. ශ්‍රම සාධකය පූර්ණ ලෙස නිෂ්පාදනය සඳහා සේවා නියුක්ත කර වීම. බොහෝ විට ඇතැම් අවස්ථාවල පූර්ණ සේවා නියුක්තිය ලෙස හඳුන්වයි.

ආර්ථික වර්ධනය යනු රටක දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවන අඛණ්ඩ ඉහළයාමකි.

(පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) ෆිස්කල් ප්‍රතිපත්තිය - සාර්ව ආර්ථික ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම.

මුල්‍ය ප්‍රතිපත්තිය : දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීම. (කරුණු 2ට ලකුණු 2)

(iii) (අ)

| සෘජු බදු | වක්‍ර බදු |
|---|---|
| ප්‍රාග්ධන ලාභ බදු | රේගු බදු |
| සමාගම් බදු | නිෂ්පාදන බදු |
| ආදායම් බදු | VAT |

(නිවැරදි වර්ගීකරණයට ලකුණු 2)

(ආ) * විචාරාත්මක දැනුවත්භාවය * සක්‍රිය සහභාගිත්වය * සමාජය ගැන සැලකිලිමත් වීම. * පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම. * සහයෝගීතාවය (කරුණු 4කට ලකුණු 2)

(iv) (අ) 1. අවදානම තනිව දැරීම නිසා අරපිරිමැස්ම වැඩිය.

2. ලාභය තනිව භුක්ති විඳින නිසා උපරිම කැපවීමෙන් ක්‍රියා කරයි.

3. ගනුනෙුකරුවන් සමඟ සෘජු සම්බන්ධතා ගොඩනගා ගත හැකිය.

4. තීරණ ගැනීමේ ස්වාධීන අයිතිය. 5. සාපේක්ෂව නීතිමය බලපෑම් අඩුවීම

6. රහස්‍යභාවය ආරක්ෂා වීම. (කරුණකට 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(ආ) ''ලාභ ලැබීමේ අරමුණින් සියල්ලන් විසින් හෝ සියල්ලන් වෙනුවෙන් ඔවුන් අතුරින් කවරෙකු හෝ ව්‍යාපාර කරගෙන යාම සඳහා පුද්ගලයන් කිහිපදෙනෙකු අතර ඇතිවන සම්බන්ධතාවය හවුල් ව්‍යාපාරයකි. (සම්පූර්ණ පිළිතුරට ලකුණු 02 යි)

'' ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා ව්‍යාපාරික සම්බන්ධතාවය හවුල් ව්‍යාපාරයකි. (මෙම නිර්වචනය ඉදිරිපත්කර ඇත්නම් ලකුණු 01 යි)

(v) (අ) 1. සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිශ්චිත කර ඇති අයදුම්පත.

2. යෝජිතනාමය දැනට පවතින නාමයකට සමාන නොවන බවට කෙරෙන ප්‍රකාශය.

3. සාංගමික ව්‍යවස්ථාවලිය.

4. එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කළයුතු කැමැත්ත දක්වීමේ ප්‍රකාශය.

5. ආරම්භක ලේකම්වරයා විසින් සමාගමේ ලේකම් ලෙස ක්‍රියා කිරීමට කැමැත්ත දක්වීමේ ප්‍රකාශය

(කරුණකට ලකුණු 1/2 බැගින් හතරකට ලකුණ 2යි)

(ආ) 1. අයිතිය බෙදීයාම වැලකීම : එනම් අයිතිය පවුලේ ඥාතීන් හිතවතුන් අත පවත්වාගත හැකිවීම.

2. අයිතිය හා කළමනාකාරිත්වය අතර ඇති දුරස්ථබව අඩුවීම.3. නීතිමය බැඳීම් අඩුවීම.

4. වැදගත් තීරණ ගැනීම වේගවත් වීම.5. ලාභය සීමිත පිරිසක් අතර බෙදාගත හැකිවීම.
6. පෞද්ගලික සමාගමක අයිතිය වෙනත් සමාගමකට පවරාගත නොහැකි වීම.
(කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

03. (i) (අ)

| **සී/ස පොදු සමාගම** | **සමුපකාරය** |
|---|---|
| 1. කොටසක මිල නිශ්චිත නොවීම | 1. කොටසක මිල රු. 100 ක් වීම. |
| 2.කොටස් අයිතිය පැවරීමට හැකිවීම | 2. කොටස් අයිතිය පැවරිය නොහැකි වීම. |
| 3. එක කොටසකට එක් ඡන්දයක් හිමිවීම. | 3. කොටස් කොපමණ ගනුලැබුවද එක් ඡන්දයක් පමණක් හිමිවීම. |
| 4. සමාගම් රෙජිස්ට්‍රර් දෙපාර්තමේන්තුවේ කිරීම. | 4. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේලියාපදිංචි ලියාපදිංචි කිරීම. |

(වෙනස්කම් 1කට ලකුණු 1/2 බැගින් වෙනස්ම් 4කට ලකුණු 2යි)

(ආ) 1. ඒකාධිකාරය පාලනය කිරීමට.
2. ලාභදායී නොවන එහෙත් මහජනයාට අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට.
3. වැදගත් මහා පරිමාණ සංවර්ධන ක්‍රම පවත්වාගෙන යාම.
4. නාස්තිය අවම කිරීම.
5. පෞද්ගලික අංශය විසින් අධික ලාභ ලැබීම නිසා ජනතාවට වන හානිය අවම කිරීම.
6. පෞද්ගලික අංශය සමඟ තරග කිරීමට ඇති අවශ්‍යතාවය
7. සමාජ සුබසාධන සේවා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය.
8. ජාතික ආරක්ෂාවට සිදුවිය හැකි තර්ජන පාලනය කිරීම.
(කරුණකට 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(ii) (අ) සමාජ ගැටළු විසඳීම සඳහා ඉදිරිපත්වන ව්‍යවසායකයන් යන අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු දෙන්න. (ලකුණු 2)

(ආ) 1. වෙනස්වන ලෝකයට අනුව වෙනස්වීමට අදාළ නව්‍යතා සම්පාදනයට
2. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට
3. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම මගින් ජීවන තත්වය නගා සිටුවීම.
4. වෙනස්වන තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමට. (ලකුණු 2)

(iii) පියවර 1 - පාවහන් යුගල නිර්මාණය කිරීම පිළිබඳ අදහස
පියවර 2 - ව්‍යාපෘති වාර්තාවක් සැකසීම.
පියවර 3 - අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය
පියවර 4 - ව්‍යාපාර ආරම්භය හා ඉදිරියට පවත්වාගෙන යාම. (ලකුණු 4)

(iv) (අ) 1. පොදු පිළිගැනීම : මුදල්වල වැදගත්ම ලක්ෂණය මෙයයි. මුදල්වලට පොදු පිළිගැනීමක් වර්තමානයේ ලැබී ඇත්තේ නීතිමය පිළිගැනීමනිසාය.
2. පහසුවෙන් හඳුනාගතහැකිවීම : මුදල්ලෙස භාවිතා කරන දේ පහසුවෙන් හඳුනාගත හැකි මට්ටමක පැවතිය යුතුය. එනම් කිසියම් නෝට්ටුවක් සැලකිල්ලට ගතහොත් එය සම ප්‍රමාණයෙන් හා හැඩයෙන් යුක්ත විය යුතුය. කාසිවලටද මෙම තත්වය තිබිය යුතුය.
3. ඉතා සුලභ හෝ දුලබ ද්‍රව්‍යයකින් මුදල් නිර්මාණය නොකර තිබිය යුතුයි.
4. පහසුවෙන් රැගෙයාම හා ගබඩාකිරීමේ පහසුව - පහසුවෙන් ගෙනයාම හා ගබඩා කිරීමට පහසුවන ලෙස ආරක්ෂාකාරී වනලෙස ද්‍රව්‍ය වලින් සාදා තිබීම හා සැහැල්ලු කුඩා ප්‍රමාණයෙන් සකසා තිබිය යුතුය.
5. මුදලේ වටිනාකම නිතර නිතර වෙනස් නොවීම - (ක්‍රයශක්තිය) මුදලේ අගය නිතර වෙනස් වන්නේනම් ගණුදෙණු කිරීම හා වටිනාකම රැක්කිරීම අපහසු වේ.
6. වංචනික ලෙස නිපදවිය නොහැකිවීම. (නිවැරදි පැහැදිලිකිරීමේ4 කට ලකුණු 1/2 බැගින් ලකුණු 4)

(ආ) ධාරක චෙක්පත : චෙක්පතේ මුද්‍රිතව පවතින 'හෝ රැගෙන එන්නාට' යන යෙදුම ඒ අයුරින්ම තිබියදී ආදායකුගේ හෝ ඒ වෙනුවට මුදල් යනුවෙන් සඳහන් චෙක්පත් ධාරක චෙක්පත් ලෙස හැඳින්වේ. ධාරක චෙක්පත් පිටසන් කිරීමකින් තොරව පැවරිය හැක. එසේම එවැනි චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කරන ඕනෑම කෙනෙකුට චෙක්පතේ වටිනාකම ගෙවීමට අණලත් බැංකුව බැඳීසිටී.
විධාන චෙක්පත : චෙක්පතේ සඳහන් 'හෝ රැගෙන එන්නාට' යන යෙදුම කපා දමා අනිවාර්යයෙන්ම අදායකයෙකුගේ නමක් සඳහන්ව ඇති චෙක්පක් හඳුන්වනුයේ විධාන චෙක්පතක් ලෙසයි. විධානන චෙක්පතක වටිනාකම ගෙවනු ලබන්නේ ආදායකයාට හෝ විධානයටයි. එවැනි චෙක්පතක් පැවරීම සඳහා පිටසන්කිරීම අනිවාර්ය වේ. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1 බැගින් 2ටම ලකුණු 2)

(v) (අ) වාණිජ බැංකුවල ද්‍රවශීලතා ගැටලු මඟහරවා ගැනීම සඳහා අවසාන ණය දෙන්නා වශයෙන් මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට ණය සැපයීමේදී අයරනු ලබන පොලී ප්‍රතිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු පොලී අනුපාතිකය යනුවෙන් හඳුන්වයි. (ලකුණු 1)
මහ බැංකු පොලී අනුපාතිකය පහත දමන විට වාණිජ බැංකු විසින් ගණුදෙනු කරුවන්ට ණය සැපයීමේදී අයරන පොලී අනුපාතිකය පහත දමන අතර ව්‍යවසායකයින් හා ව්‍යාපරිකයින්ට ණය ලබාගැනීමේ හැකියාව වැඩිවන අතර ඒ තුළින් නව ව්‍යාපාර ඇරඹීමටත්, පවතින ව්‍යාපාර පුළුල් කිරීමටත් හැකියාව ලැබෙන අතර ඒ නිසාම ව්‍යාපාර ක්ෂේත්‍රය දියුණු වේ. (නිවැරදිව පැහැදිලි කිරීමකට ලකුණු 1යි)

(ආ) භාණ්ඩාගාර බිල්පත් : රජයට අවශ්‍ය කෙටිකාලීන ණය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරලත් නියෝජිතයන් මාර්ගයෙන් සාමාන්‍ය ආයෝජකයන්ට භාණ්ඩාගාර බිල්පත් අලෙවිකිරීම භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ කටයුතු ලෙස සැලකේ. මේවා දින 91, 182, 364 යන කාලසීමාවන් සඳහා නිකුත් කෙරේ. (අදහස නිවැරදිව පැහැදිලි කර ඇත්නම් ලකුණු 1)

භාණ්ඩාගාර බැඳුම්කර : රජයට අවශ්‍ය මධ්‍යකාලීන සහ දිගුකාලීන ණය සපයා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂයකි. මේවායේ පරිණතවීම වර්ෂ දෙකේ සිට වර්ෂ 20 දක්වා වූ විවිධ කාලසීමා යටතේ සිදුවේ
(නිවැරදිව අදහස ලියා ඇත්නම් ලකුණු 1)

04. (i) (අ) මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තකළ හානියක් සිදුවීමට ඇති ඉඩකඩ අවදානම ලෙස හඳුන්වනු ලබයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) * නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ අදහස. * අර්පනය හෙවත් යෝජනාවක් තිබීම. * ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම. * නීතියට එකඟවීම. * ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇතිකර ගැනීමට ඇති හැකියාව. (කරුණු 4කට ලකුණු 2)

(ii) (අ) ගිනි රක්ෂණයක් යටතේ අතිරේක වාරික මුදල් ගෙවා ජලගැලීම්, සුළි සුළං, කුණාටු ආදියෙන් සිදුවන හානි සඳහාද ආවරණය ලබාගත හැකි බැවින් ගිනි රක්ෂණය යටතේ ජලගැලීම් වලින් සිදුවන හානි සඳහාද වන්දි ලබාගැනීමේ හැකියාව පවතී. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) * පණිවුඩයේ ස්වභාවය. * පූර්ණත්වය * නිවැරදි බව * ආචාරශීලී බව * සංක්ෂිප්තය * නිශ්චිත බව * තේරුම්ගැනීමේ හැකියාව (කරුණු 4 කට ලකුණු 2යි)

(iii) (අ) * නව තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳව ඇති දැනුම දුර්වලවීම.
* සන්නිවේදන උපකරණ භාවිතයේදී සිදුවන බාහිර බාධා.
* පැරණි සන්නිවේදන ක්‍රම භාවිතයට ගැනීම.
* සන්නිවේදන ගලායාමේ මාර්ගයේදී ඇතිවන බාධා.
* භාෂා ප්‍රශ්න, දැනුම ආකල්ප ආදියෙහි නොගැලපීම් ආදිය. (කරුණු 4කට ලකුණු 2)

(ආ) නිෂ්පාදකයාට : * නිෂ්පාදකයාට අවශ්‍ය තොරතුරු සැපයීම. * ප්‍රදර්ශණ පුවරු, පෝස්ටර් ප්‍රදර්ශණය, සාම්පල් බෙදාදීම යනාදී කටයුතු මගින් භාණ්ඩ ප්‍රවර්ධනයට සහයා දීම.

පාරභෝගිකයාට : * පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වේලාවට ලබාදීම. * පාරිභෝගිකයාට භාණ්ඩ හඳුන්වාදීම. * පාරිභෝගිකයාට ණයට භාණ්ඩ සැපයීම. * භාණ්ඩ පරිහරණය කරනුලබන ආකාරය පැහැදිලි කරදීම.(කරුණු 4කට ලකුණු 2)

(iv)(අ) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ පමණක් අළෙවි කිරීමට ගිවිසුමක් මගින් බැඳී ක්‍රියාත්මක වන වෙළඳසැල් බැඳී වෙළඳසැල්වේ. (පැහිලි කිරීමට ලකුණු 2)

(ආ) විදේශ රටවලින් ආනයනය කරන ලද ද්‍රව්‍ය වරාය තුළදී නැවත සකසා හෝ සැකසීමකින් තොරව අපනයනය කිරීම අන්තරාල වෙළඳාම වේ ආනයනය කරන ලද ද්‍රව්‍ය රටතුළට ගෙනවිත් වෙනසකට භාජනය කර හෝ ඒ ආකාරයෙන්ම නැවත අපනයනය කිරීම ප්‍රති අපනයනය කිරීම වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(v) විදේශ වෙළඳාමට ඇති බාධා
තීරු බදු බාධක තීරු බදු නොවන බාධක (ලකුණු 1)
* ආනයන අපනයන වෙළඳාමේදී රේගුව විසින් අයකරනු ලබන බදු තීරු බදු ලෙස හඳුන්වයි.
උදා : ඕනෑම ආනයන අපනයන තීරු බදු සඳහන් කිරීමකට ලකුණු ලබාදෙන්න.
(නිදසුන් සහිත පැහැදිලි කිරීමට ලකුණු 1 1/2)
* තිරු බදු නොවන අනෙකුත් බාධක මේ යටතට ඇතුළත් කෙරේ. උදා : ආනයන අපනයන තහනම් කිරීම්, ආනයන අපනයන සීමා කිරීම්. වෙළෙඳ ගිවුම්. (නිදසුන් සහිත පැහැදිලි කිරීමට ලකුණු 1 1/2)

05. (i) (අ) Robert katz විසින් අත්‍යවශ්‍ය කුසලතා වර්ග 3ක් හඳුනාගෙන ඇත. ඒවා නම් තාක්ෂණික, මානව මං සකල්පනාත්මක නිපුණතාවයන්ය.

තාක්ෂණික කුසලතා : ආයතයක් තුළ සිදුකරනු ලබන විශේෂිත වූ කාර්යයන් ඉටුකර ගැනීම හෝ තේරුම් ගැනීම සඳහා අවශ්‍ය නිපුණතා තාක්ෂණික නිපුණතා ලෙස හැඳින්වේ. මෙම නිපුණතාවය වඩාත් වැදගත් වනුයේ පහළ මට්ටමේ කළමනාකරුවන්ට ය. මක්නිසාද ඔවුන් ආයතනයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට දායක වන පිරිස් අධීක්ෂණය හා මෙහෙයවීම සිදුකරනු ලබයි.

මානව නිපුණතා : තනිව හෝ කණ්ඩායම් වශයෙන් අන් අය සමග' කටයුතු කිරීමේ හැකියාව මින් අදහස් කෙරේ. සියලුම කළමණාකරණ මට්ටම් වලට අයත් කළමණාකරුවන් පුද්ගලයන් සමග' කටයුතු කිරීම හේතුවෙන් මෙම කුසලතා සියළුම මට්ටම්වල කළමණාකරුවන්ට අවශ්‍ය වේ.

සංකල්පනාත්මක නිපුණතා : සංකීර්ණ අවස්ථාවල දී සංකීර්ණ තිරණ ගැනීම සඳහා සිතීමේ හා තේරුම් ගැනීමේ කුසලතා මින් අදහස් කෙරේ. මෙම නිපුණතා ඉහළ කළමණාකරණ මට්ටමේ කළමණාකරුවන්ට ඉතා වැදගත් වේ. මන්දයත් ඔවුන්ට ආයතන සමස්තයක් ලෙස තේරුම් ගැනීමට හා පාරිසරික වෙනස්වීම් වලට අනුගතවීම තුළින් සංකීර්ණ තීරණ ගැනීමට සිදුවීමයි.

(ආ) 1. ඉහළ සේවක පිරිවැටුම. 2. රැකියාවට නොපැමිණීම.
3. කලට වේලාවට වැඩ නොකිරීම 4. කම්මැලිවීම.
5. අඩු ඵලදායකත්වය 6. කාර්යයෙහි ගුණත්වය අඩුවීම සහ අපතය
6. දුර්වල අන්තර් පුද්ගල සම්බන්ධතා සහ ගැටුම් 8. කාර්මික අසහනය/වැඩ වර්ජන

(ii) (අ) 1. සිය ක්ෂේත්‍රය තුළ විශේෂඥ හැකියාව . (Expert power) 2. නිර්මාණශීලිත්වය (Creativity)
3. අපක්ෂපාතීත්වය 4. මානව දයාව 5. දුර දක්නා නුවණ 6. ධනාත්මක චින්තනය
7. ආදර්ශවත් වීම 8. දරා සිටීමේහැකියාව 9. විචක්ෂණශීලී වීම 10. නොසැලී සිටීම.

(ආ) 1. මධ්‍යගතවීම හෝ විමධ්‍යගතවීම 2. දෙපාර්තමේන්තුකරණය 3. අණකිරීමේ ඒකීයතාවය
4. පාලන අවකාශය 5. නීතිරීති හා ක්‍රියාපටිපාටි 6. සමායෝජනය
7. ධූරාවලිය 8. කළමණාකරණ මට්ටම්

(ii) (අ) 1. අවශ්‍ය තොරතුරු නොලැබීයාම නිසා ව්‍යාපාරික තීරණ අසාර්ථක වේ.
2. සැපයුම්කරුවන්, ගණුදෙණුකරුවන්, මුල්‍ය ආයතන යනාදී පාර්ශවයන් සමග' සන්නිවේදනය අඩාල වීම නිසා අලාභ සිදුවීම.
3. සේවකයන්, කොටස්කරුවන් හා වෙනත් ආයතන සමඟ සම්බන්ධතා අඩපණ වීම නිසා අසහනකාරී තත්ත්වයන් ඇතිවිය හැක.
4. පරිපාලන ගැටළු ඇතිවීම. 5. සැලසුම්කරණයට බාධා ඇතිවීම.

(ආ) 1. සමීප සුපරික්ෂණය හා මනා පාලනය
2. තොරතුරු ගලායැම වේගවත් වන අතර තීරණ ගැනීමටද අදාළ සන්නිවේදනය ද වේගවත් වේ.
3. අනුගාමිකයන්ගේ කටයුතු මනාව සම්බන්ධීකරණය කළ හැකිවේ.
4. කළමනාකරුවන්ට විශාල ගැටළු ප්‍රමාණයකට මුහුණදීමට සිදුනොවේ.

(iv) 1. පෙර පාලනය (Pre Control) : කල්තියා පාලන ක්‍රම හඳුන්වාදීම සිදුකරයි.
2. ප්‍රවර්තන/සමගාමී පාලනය (ConcurrentControl) : කාර්යයන් කෙරෙන අතරතුර දී පාලන ක්‍රම හඳුන්වාදීම හෝ පවතින පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.
3. පාලනය (Post Control) : මෙහි දී ප්‍රතිඵලය පසුපෝෂණයක් ලෙස ක්‍රියාත්මක වී ඒ ඇසුරෙන් පාලන උපක්‍රම යොදවයි.

(v) (අ) නිෂ්පාදන ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුවන අයුරින් හා පාරිභෝගික අරමුණුවන ගෙවන මිලට සරිලන ආකාරයට ඉහළ ගුණත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙයවීම, පාලනයට අදාළ කළමණාකරණ කටයුතුවල සංකලනයකි.
(ඉහත කරුණු අඩංගු පිළිතුරට ලකුණු 2)

(ආ) 1. ගුණත්ව පාලනය 2. තොග පාලනය 3. පිරිවැය පාලනය 4. යාන්ත්‍රික පාලනය 5. ක්‍රියාකාරිත්ව පාලනය (එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4ට ලකුනු 2)

06. (i)

| යෙදවුම් ⟶ | පරිවර්තන ක්‍රියාවලිය ⟶ | නිමවුම |
|---|---|---|
| භූමිය | සම්පත් ලබාගැනීම | ගුණත්වයෙන් |
| ශ්‍රමය | නිෂ්පාදන ක්‍රියාපටිපාටිය හා | යුතු |
| ප්‍රාග්ධනය | ක්‍රම නීර්ණය කරමින් | භාණ්ඩ හා |
| ව්‍යවසාය | තාක්‍ෂණය යොදාගනිමින් | සේවා |
| දැණුම | නිෂ්පාදනය කිරීම. | |
| තොරතුරු | | |
| කාලය | | |

(සාධකද ඇතුළුව ක්‍රියාවලිය දක්වා ඇත්නම් ලකුණු 2යි. ක්‍රියාවලිය පමණක් නම් ලකුණු 1යි)

ඉහත පරිවර්තන ක්‍රියාවලිය තුළ උදාහරණයක් ලෙස නිස්පාදන සාධකයක් ගෙන එක් එක් පරිවර්තන අවස්ථාවල යම් වටිනාකම වැඩිවන අයුරුත් දක්වා ඇත්නම් ලකුණු 2යි. එසේ නොමැතිනම් පිළිතුර දී ඇති ආකාරය අනුව ලකුණු ප්‍රමාණවත් අයුරින් දෙන්න.

(ii) (අ) කාර්යක්‍ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීමට අවශ්‍ය වන්නාවූ කාර්ය වැඩපල මධ්‍යස්ථානය, ද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ, සහාය සේවා යනාදිය සාර්ථක අයුරින් සැලසුම් කිරීමයි.
(ඉහත කරුණු ඇතුළත් වූ පිළිතුරට ලකුණු 2)

(ආ) 1. ද්‍රව්‍ය හා යන්ත්‍ර භාවිතා කිරීමේ කාර්යක්‍ෂමතාවය වර්ධනය
2. නිෂ්පාදනයේ ඉඩකඩවලින් ප්‍රයෝජන ගැනීම.
3. ද්‍රව්‍ය හා සේවක චලනයේදී ඇතිවන දුෂ්කරතා, අවහිරතා අනතුරු අවම කිරීම.
4. සේවක චිත්ත ධෛර්යය ඉහළයාම 5. ද්‍රව්‍ය භාවිත පිරිවැය අඩුවීම.
6. නිෂ්පාදන අංශ අතර තොරතුරු සන්නිවේදනය, සුපරික්ෂණයආදිය පහසු වීම.
(කරුණු 4ක් දක්වා ඇත්නම් ලකුණු 2යි, කරුණු 2ක් නම් ලකුණු 1, 2ට අඩුනම් ලකුණු නැත)

(iii) (අ) යලි ඇනවුම් මට්ටම = උපරිම පරිභෝජනය x උපරිම යලි ඇණවුම් කාලය
= 120 x 30 = ඒකක 3600// (ලකුනු 1)

අවම තොගමට්ටම = යලි ඇණවුම් මට්ටම - (සාමාන්‍ය පාරිභෝජනය x සාමාන්‍ය ඇණවුම්කාලය)
= 3600 - (100 x 25) = ඒකක 1100// (ලකුණු 1)

(ආ) නියමිත කාලයක් තුළ සංවිධානයක යෙදවුම් හා නිමවුම් අතර ඇති අනුපාතික සම්බන්ධතාවය ඵලදායීතාවයයි. (ලකුණු 1)

අනුපාතික සම්බන්ධතාවයෙන් ලැබෙන පිළිතුර එකට වැඩිනම් ඵලදායීතාවය වර්ධනය ලෙසින්ද ලැබෙන පිළිතුර එකට අඩුනම් ඵලදායීතාවය පිරිහීම ලෙසින්ද දැක්විය හැකිය.
(පැහැදිළිව පිළිතුර ඉදිරිපත්කර ඇත්නම් ලකුණු 1යි)

(iv) (අ) පුද්ගලයන්ගේ හා කණ්ඩායම්වල අවශ්‍යතා හා වුවමනා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය වටිනාකමක් ඇති භාණ්ඩ හා සේවා වෙනත් අය ලවා නිර්මාණය කිරීම, ඉදිරිපත් කිරීම සහ නිදහසේ හුවමාරු කිරීම සඳහා වූ සමාජයීය ක්‍රියාවලිය අලෙවිකරණයයි.
(නිවැරදිව ඉදිරිපත් කර ඇති සම්පූර්ණ පිළිතුරට ලකුණු 2යි)

(ආ) 1. නිෂ්පාදන සංකල්පය 2. නිෂ්පාදිත සංකල්පය 3. විකුණුම් සංකල්පය
4. අලෙවිකරණ සංකල්පය 5. සමාජයීය අලෙවිකරණ සංකල්පය
6. ගණුදෙණුකරු සංකල්පය 7. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය
(අනුපිළිවෙළට කරුණු 7ම සඳහන් පිළිතුරට ලකුණු 2යි. කරුණු 6කට ලකුණු 1 1/2 යි, කරුණු 5 කට ලකුණු 1 යි, කරුණු 4 කට ලකුණු 1/2යි. කරුණු 4ට අඩුනම් ලකුණු නැත.)

(v) (අ) **වෙළෙඳපොළ ඛණ්ඩනය :** විෂම ගති ලක්ෂණ වලින් යුක්ත සමස්ථ වෙලෙඳපොළ සමජාතීය ගති ලක්ෂණ වලින් යුක්ත වූ කණ්ඩායම් වලට බෙදා වෙන්කිරීම වෙළඳපොළ ඛණ්ඩනයයි.
(නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 1යි)

වෙළෙඳපොළ ඛණ්ඩනයට යොදාගන්නා පදනම් :
1. භූගෝලීය සාධක 2. ප්‍රජා විද්‍යාත්මක සාධක 3. මනෝ විද්‍යාත්මක සාධක
4. චර්යාත්මක සාධක (කරුණු 2කට 1/2 බැගින් කරුණු 4ටලකුණු 1යි)

(ආ) 1. නිෂ්පාදිතය 2. මිල 3. බෙදාහැරීම/ස්ථානය 4. ප්‍රවර්ධනය 5. මිනිසුන් 6. ක්‍රියාවලිය
7. භෞතික වටපිටාව/භෞතික පරිසරය
(කරුණු 7ම සඳහන් පිළිතුරට ලකුණු 2යි, කරුණු 6කට ලකුනු 1 1/2 යි. කරුණු 5කට ලකුණු 1යි, කරුණු 5කට අඩුනම් ලකුණු නැත

07. (i) (අ) මිල යනු : භාණ්ඩයක් හෝ සේවාවක් වෙනුවෙන් අයකරන මුදල් ප්‍රමාණය මිල වේ.
නැතහොත්
භාන්ඩයක් හෝ සේවාවක් ලබාගැනීම හෝ භාවිතා කිරීම තුළින් පාරිභෝගිකයා ලබන ප්‍රතිලාභය හා තෘප්තිය වෙනුවෙන්හුවමාරු කර ගැනීමට කැමති වටිනාකම මිල වේ.

(ආ) පිරිවැය පදනම් කරගත් ක්‍රම :
1. පිරිවැයටලාභාන්තිකයක් එකතුකළ මිල 2. ඉලක්ක ඉපයීම මත මිලකිරීම.
(කරුනු දෙකම සඳහන් පිළිතුරට ලකුණු 1 යි)

ඉල්ලුම පදනම්කරගත් ක්‍රම :
1. සංජානනීය වටිනාකම් මත මිල කිරීම. 2. වටිනාකම් මිල කරණය
(කරුණු දෙකම සඳහන් පිළිතුරට ලකුණු 1යි)

(ii) ඇසුරුම්කරණය : නිෂ්පාදිතයක් සඳහා දවටනයක් හෝ බහලුමක් නිර්මාණය කිරීමේ හා නිපදවීමේකාර්යය ඇසුරුම්කරණය වේ. (ඉරි ඇඳි පද සහිත පැහැදිලි කිරීමට ලකුණු 1 යි)
ඇසුරුම : නිෂ්පාදිතය සඳහා නිපදවන ලද දවටනය හෝ බහලුම ඇසුරුම වේ.
(ඉරි ඇඳි පද සහිත පැහැදිලි කිරීමට ලකුණු 1 යි)

ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු :
1. නිෂ්පාදනයේ ස්වභාවය 2. ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන
3. තාක්ෂණික යෝග්‍යතාව 4. ඇසුරුම් අංග 5. වර්ණය හා කියවීමේ පහසුව
6. වෙළෙන්දාට ඇති පහසුව 7. පාරිභෝගිකයාටඇති පහසුව 8. පරිසර හිතකාමී බව
9. පිරිවැය (කරුණු 2කට 1/2 බැගින් කරුණු 8කට ලකුණු 2යි

(iii) (අ) 1. දැනුම්දීම 2. සිහිපත් කිරීම 3. පෙළඹවීම 4. දිරිමත් කිරීම 5. තහවුරු කිරීම.
(අරමුණු 2කට 1/2 බැගින් අරමුණු 4ක් නම් කිරීමට ලකුණු 1)

1. දැනුම් දීම : භාණ්ඩය වෙළඳපොළට ඉදිරිපත් කර ඇති බවත් එම භාණ්ඩය පිළිබඳ විස්තර දැනුම්දීම මෙහිදී සිදුකෙරේ.
2. සිහිපත් කිරීම : විකල්ප භාණ්ඩ තිබෙන නිසා ඒවා මිලදී ගැනීම වළක්වාලීමට අදාළ භාණ්ඩය පිළිබඳ නැවත නැවත කරුණු ඉදිරිපත් කිරීම.
3. පෙළඹවීම : භාණ්ඩය මිලදී ගැනීමට පාරිභෝගිකයා තුළ කැමැත්තක් ඇතිකිරීම.
4. දිරිමත් කිරීම : ආයතනයේ නිෂ්පාදන නිවැරදි ඒවා බව දක්වමින් ඒ නිෂ්පාදිත හඳුනාගැනීමට අදාළ තොරතුරු ලබා දීම තුළින් භාණ්ඩය මිලදී ගැනීමට පාරිබෝගිකයා දිරිමත් කිරීම.

5. තහවුරු කිරීම : භාණ්ඩයේ ගුණත්වය පිළිබඳව හා ඉන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව සුප්‍රකට පුද්ගලයන් මගින් කරුණු ඉදිරිපත් කරමින් තහවුරුවක් ලබා දීම.

(අරමුණු දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 1/2 බැගින් අරමුණු 4කට ලකුණු 1යි)

(ආ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට පොළඹවන්නා වූ කෙටි කාලීන දිරිගැන්වීම් විකුණුම් ප්‍රවර්ධනය ලෙස හැඳින්වේ. එනම් කෙටිකාලයකින් විකුණුම් වැඩිකර ගැනීමේ අරමුණින් ආයතනයක් විසින් සැලසුම් කරන උපක්‍රම වේ. (පැහැදිලිව දක්වා ඇති පිළිතුරට ලකුණු 1යි)

විකුණුම් ප්‍රවර්ධන ක්‍රම :

1. පාරිභෝගික ප්‍රවර්ධනය/ගනුදෙනුකරු ප්‍රවර්ධනය 2. වෙළඳ ප්‍රවර්ධනය

3. වෙළඳ සේවක ප්‍රවර්ධනය(කරුණු තුනම සඳහන් පිළිතුරට ලකුණු 1යි, කරුණු දෙකක් නම් ලකුණු 1/2 යි.)

(iv) (අ) ව්‍යාපාර වත්කම් වල අගය උපරිම කිරීම, ලාභ උපරිම කිරීම, කොටසක අගය උපරිම කිරීම.(ලකුණ් 2)

(ආ) ආයෝජන තීරණ : ස්ථාවර වත්කම් හා ජංගම වත්කම්වල ආයෝජනය කිරීම සම්බන්ධ තීරණයි.

මූල්‍යන තීරණ : ස්ථාවර හා ජංගම වත්කම්වල ආයෝජනය සඳහා මුදල් කෙසේ සපයාගත යුතුද යන්න පිළිබඳ තීරණ.

(v) (අ) 1. කාර්යක්ෂම හා ඵලදායී මුදල් ආයෝජනයකට යොමුවිය හැකිවීම.

2. අනාගත මුදල් ඌනතා පෙරාතුව හඳුනාගත හැකිවීම හා ඊට පිළියම් යෙදියහැකිවීම.

3. සත්‍ය ගණුදෙණු සමග සසඳ බැලිය හැකි නිසා සැලසුම්කරණය හා පාලනය පහසුවීම. (පිළි.2ක් සඳහාල.2)

(ආ) කෙටිකාලීන අරමුදල් අවශ්‍යතා : සුදුසු උදාහරණ සහිත පිළිතුරකට ලකුණු 1

දිගුකාලීන අරමුදල් අවශ්‍යතා : සුදුසු උදාහරණ සහිත පිළිතුරකට ලකුණු 1 (ලකුණු 2)

08. (i) (අ) අවශ්‍ය අරමුදල් ප්‍රමාණය, අවශ්‍යවන කාලසීමාව, පිරිවැය, ව්‍යාපාරයේ ස්වභාවය, ප්‍රාග්ධන ව්‍යුහයට ඇතිවන වෙනස්වීම්. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක කෙටිකාලීන වගකීම් පියවීමට එම ව්‍යාපාරයට ඇති හැකියාව පෙන්නුම් කරයි.

ජංගම අනුපාතය - Current Rates ක්ෂණික අනුපාතය - Quick rates (ලකුණු 2)

(ii) (අ) ආයෝජන හා ආයෝජන ප්‍රතිලාභ අතර සබඳතාවය දක්වන අනුපාතයයි.

උදා : තොග පිරිවැටුම් අනුපාතය, ණයගැති පිරිවැටුම් අනුපාතය. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ආයෝජන සම්බන්ධයෙන් ගනු ලබන තීරණයකි.

උදා : ව්‍යාපාර සංවර්ධන තීරණ, ව්‍යාපාර නවීකරණය කිරීමේ තීරණය. (ලකුණු 1)

සලකා බලන කරුණු :

1. ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභ 2. අවදානම 3. පිරිවැය 4. ආයතනයේ ආයෝජන ප්‍රතිපත්ති (ලකුණු 1

(iii) අරමුදල් සපයන්නන් සහ මිලදී ගන්නන් හමුවීමට ඇති සංවිධානය මූල්‍ය වෙළඳපොළයි. මෙහිදී මූල්‍යමය වත්කම් මිලට ගැනීම හා විකිණීම සිදුවේ.

උප වෙළඳපොළ :

අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොළ

රජයේ සුරැකුම්පත් වෙළඳපොළ ආදී. (ලකුනු 4)

(iv) (අ) 1. සජීවී හා සක්‍රීය සම්පතක් වීම. 2. සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකිවීම.

3. අනෙකුත් සියලු සම්පත් පාලනය කළහැකි වීම. 4. පුහුණු කළහැකි බව.

5. කණ්ඩායම් වශයෙන් කටයුතු කළහැකි වීම.

6. කාලය ගතවීමත් සමඟ ලබන අත්දැකීම් තුළින් සේවකයාගේ අගය වැඩිවීම.

7. චර්යාවන් ඉතාමත් සංකීර්ණවීම සහ පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වීම.

8. විවිධාකාර නිර්මාණශීලී බව (කරුණු 4කට ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(ආ) 1. ආයතනය තුළට ඇතුළත්වීමට අපේක්ෂාකරන දක්ෂ පුද්ගලයින් ආයතනයට ආකර්ෂණය කර ගැනීමට නොහැකිවීම.

2. නව අදහස්, නව යෝජනා සහිත පුද්ගලයින් ආකර්ෂණය කරගත නොහැකි වීම.

3. නව නිර්මාණ. නව අදහස් ඇති ක්‍රියාකාරී තරුණ සේවකයන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවීම

4. එම ආයතනයේ සේවකයින්ම ආකර්ෂණය කර ගැනීම නිසා බාහිරින් උද්යෝගී පුද්ගලයින් ඇතුළත් කර ගැනීමට නොහැකිවීම.

5. ආයතනයට අවශ්‍ය නව වෙනස්කම් සිදු කිරීමට බාධා ඇතිවීම.

(සුදුසු නිවැරදි කරුනු 4ක ලකුණු 1/2 බැගින් ලකුණු 2)

(v) (අ) ආයතනයක අරමුණු සහ 'පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස අනාගත **සේවක අවශ්‍යතා නිශ්චය කිරීම හාඑම අවශ්‍යතා ඉටුකර ගැනීම** පිණිස ගතයුතු **ක්‍රියාමාර්ග තීරණය කිරීම** පිළිබඳ ක්‍රියාවලිය මානව සම්පත් සැලසුම්කරණය වේ. (ඉරි ඇඳිපද සහිත නිවැරදි පිළිතුරට ලකුණු 1)

(ආ) 1. භාණ්ඩය/සේවය සඳහා වූ ඉල්ලුම 2. ආයතනයේ පරමාර්ථ 3. නිෂ්පාදන ක්‍රමය

4. අනාගත සේවක විශ්‍රාම යෑම 5. ඉල්ලා අස්වෙන සේවක ප්‍රමාණය

6. උසස්වීම් ලබන සේවක සංඛ්‍යාව 7. අනාගත ව්‍යාපෘති

8. සේවය අවසන් කිරීම. (කරුණු 2කට ලකුණු 1/2 බැගින් කරුණු 6කට ලකුණු 3)